සියලුම හිමිකම් ඇවිරිණි/எல்லா உரிமைகளும் உடையது/All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Westrn Province

# ශිෂ්‍යත්ව ප්‍රතිඵල සංවර්ධන වැඩසටහන - 2026

කට්ටල අංක 06

## පෙරහුරු ප්‍රශ්න පත්‍රය

EXAMINATION FOR GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOC AND FOR THE AWRRD OF BURSARIES

පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වන ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය

## I පත්‍රය

පැය එකයි.

විභාග අංකය :.........................................

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස් :**

* ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත ලියන්න.**
* **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය** ලියන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40ක් ඇත. **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
* සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු තුන බැගින් දී ඇත. ඒවා අතුරෙන්, එක් එක් ප්‍රශ්නයට අදාළ **නිවැරදි පිළිතුර තෝරාගෙන ඊට යටින් ඉරක් අඳින්න.**
* කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.


**උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.**

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 02 | |
| 03 | |
| 04 | |
| 05 | |
| 06 | |
| 07 | |
| 08 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කේත් අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක** ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම් කළ බව සහතික කරමි | V/I/S |
| **දෙවන පරීක්ෂක** පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක** ඇගයීම් කර, ප්‍රදනය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි | V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක** අධීක්ෂණය කළෙමි අවසාන ලකුණ නිවැරදිය | V/I/S/CH |


[දෙවැනි පිටුව බලන්න.

1. මුලින් දැක්වෙන වෘත්තයේ ඇතුළත් රූප, හැඩයෙන් හා ප්‍රමාණයෙන් සමාන වන වෘත්තය තෝරන්න.



(1) (2) (3)

2. වෙනස් රූපය තෝරන්න.




(1) (2) (3)

3. පහත වැකියේ යටින් ඉරි ඇඳි පදයට අදාළ විරුද්ධාර්ථ පදය ඊට ඉදිරියෙන් ඇති හිස්තැනට ගැළපූ විට අර්ථවත් වාක්‍යයක් ලැබේ. මේ අනුව හිස්තැන් සඳහා සුදුසු වචන ලැයිස්තුව තෝරන්න.

මාලක **සෙමෙන්** එවන ලද පන්දුවට තිසර ...................................... පහර දුන්නේ ය. එවිට **ඉහළ** නැගුණු පන්දුව .........................ට ඒමට පෙර ලකුණක් ලබා ගැනීම **ආරම්භ** කළ ද එය ........................ කර ගැනීමට නොහැකි වූයේ දසුන් උඩ පන්දුව රැක ගත් නිසා ය.

(1) වැරෙන්, බිම, ඉවරයක් (2) වේගයෙන්, පහළ, අවසාන (3) හයියෙන්, පිටිය, අවසන්

4. පහත දැක්වෙන කොටුවේ රූප යෙදී ඇති රටාව හඳුනාගෙන **?** ලකුණ ඇති තැනට ගැළපෙන රූපය තෝරන්න.




(1) (2) (3)

5. මාසයකට සති 4ක් පමණක් ම ඇති මාසය අයත් වන වර්ෂය මින් කුමක් ද?

(1) 2020 (2) 2024 (3) 2026

**6.** එකම ඉලක්කම තුන් වතාවක් ගුණ කර ලැබෙන පිළිතුර ම එම ඉලක්කම දෙවතාවක් එකතු කර එම ඉලක්කමෙන් ම ගුණ කර ලැබෙන පිළිතුරට සමාන වේ. එම ඉලක්කම කුමක් ද?

(1) 1 (2) 2 (3) 3

**7.** සිද්ධියක අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

a. **ඉතින් වෙද මහත්තයා මොකද කිවුවේ?**
b. **කොල්ලට පණු අමාරුව කිවුවා.**
c. **අද උදේ දරුවත් එක්ක කොහෙද ගියේ?**
d. **රාක්කෙ ඇති, බෝතලයෙන් මී පැණි ටිකක් ගන්න.**
e. **ඉඟුරු කෑල්ලක් නම් හොයා ගත්තා මී පැණි ටිකක් තමයි නැත්තෙ.**
f. **පොඩි එකාට බෙහෙත් ටිකක් ගන්න.**

(1) c f a d e b (2) c f a b e d (3) c f a d b e

**8.** පහත කවියෙන් කියවෙන සත්ත්වයා කවුද?

රෑ දහවල අඳුරට ප්‍රිය කරන්නේ
පා සයකින් පියාපතින් යන එන්නේ
මගෙ නාදය මුඛයෙන් නම් නොම එන්නේ
ඕං ඉතින් මං කවුදැයි කියපන්නේ

(1) වවුලා (2) උලමා (3) රෑහැයියා

**9.** මිදුලේ සමපාද ත්‍රිකෝණයක් ඇඳගත් ළමුන් තිදෙනෙකු දිශා අනුව, එහි මුළුවල සිටගත්තේ මෙසේ ය. රමිත නිදුකට වයඹ දිශාවෙන් ද තාරුක රමිතට නැගෙනහිර දිශාවෙන් ද සිට ගත්හ. මේ අනුව තාරුක සිටින්නේ නිදුකට කුමන දිශාවෙන් ද?


(1) ඊසාන (2) නිරිත (3) බටහිර

**10.** 2025 පෙබරවාරි 28 වන දින සිකුරාදා දවසක් වූ අතර 2026 පෙබරවාරි 28 වන දින සෙනසුරාදා දවසකි. මේ අනුව 2027 පෙබරවාරි 28 වන දින ඉරිදා දවසක් නම් 2028 පෙබරවාරි මාසයේ අවසාන දිනය යෙදෙන දවස කුමක් වේද?


(1) සඳුදා (2) අඟහරුවාදා (3) ඉරිදා

**11.** පහත ගණිත කර්ම සිදු කොට ඒවායේ පිළිතුරු ඇසුරින් සාදා ඇති නිවැරදි සංඛ්‍යා සැකැස්ම තෝරන්න.


- ☐ දහසය තුනෙන් ගුණ කරන්න.
- ☐ නවසිය විසි තුනෙන් හාරසිය දහහතක් අඩු කරන්න.
- ☐ අනූ තුන තුනෙන් බෙදන්න.
- ☐ එකසිය හැත්තෑ අට පහෙන් ගුණ කරන්න.




(1)




(2)




(3)

4 වන පිටුව බලන්න.

**12.** එක ළඟ පිහිටි ඔත්තේ සංඛ්‍යා පහක එකතුව 445කි. එහි විශාල ම සංඛ්‍යාවත් කුඩා ම සංඛ්‍යාවත් අතර වෙනස කීය ද?

(1) 8 (2) 6 (3) 4

**13.** ජනිත පැවසුවේ තමාට බාප්පලා තිදෙනෙකු සහ මහප්පලා දෙදෙනෙකු සිටින බවයි. ජනිතගේ බාප්පා කෙනෙකුගේ පුතෙකු වන නිකිත පැවසුවේ තමාට මහප්පලා හතර දෙනෙකු සිටින බවයි. මේ අනුව නිකිතගේ පියාට සිටින වැඩිමහල් සහ බාල සහෝදරයන් ගණන පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) 4, 2 (2) 4, 1 (3) 5, 0


**14.** ළමුන් 10 දෙනෙකු වමතට වමතත් දකුණතට දකුණතත් වන ලෙසට අත් අල්ලාගෙන වෘත්තයක් සාදා ඇත. මෙම ළමුන් හා සම්බන්ධ **වැරදි** ප්‍රකාශය තෝරන්න.

(1) ළමුන්ගෙන් හරි අඩක් බැගින් වෘත්තයේ ඇතුළටත් වෘත්තයෙන් පිටතටත් මුහුණලා සිටී.


(2) සියලුම ළමුන් වෘත්තය ඇතුළතට හෝ පිටතට මුහුණලා සිටී.

(3) එක් ළමයෙකු හැර ළමයෙකු බැගින් වෘත්තයේ ඇතුළටත් පිටතටත් මුහුණලා සිටී.


**15.** A හා B යනු විවිධ සලකුණු සහිත කඩදාසි පටි දෙකකි. B කඩදාසි පටියේ හිස් කොටු ඇත්තේ ඒවායේ තිබූ සලකුණු කපා ඉවත්කර ඇති නිසා ය. A කඩදාසියේ  සලකුණ මත B කඩදාසියේ  සලකුණ සිටින සේ කඩදාසි පටි දෙක එක මත එක තැබූ විට දක්නට ලැබෙන රූපය තෝරන්න.




A B



(1)



(2)




(3)

**16.** විශාල ටැංකියකට ජලය පුරවා එක සමාන නළ තුනකින් එක ම ප්‍රමාණයේ කුඩා ටැංකි තුනකට එකවර ජලය පුරවන ලදි. මේ අනුව දී ඇති ප්‍රකාශවලින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) භාජන තුන ම එකවර ජලයෙන් පිරී යයි.

(2) C භාජනය ඉක්මනින් ම ජලයෙන් පිරී යයි.

(3) B හා C භාජනයට පෙර A භාජනය ජලයෙන් පිරී යයි.




**17.** නිදසුන බලා දී ඇති හිස්තැන්වලට ගැළපෙන පිළිතුර තෝරන්න.

**නිදසුන :-** බස්නාහිර - කොළඹ - කැලණි ගඟ

දකුණු - .................................. - නිල්වලා ගඟ

නැගෙනහිර - ත්‍රිකුණාමලය - ..................................

.................................. - හම්බන්තොට - වලවේ ගඟ

(1) මාතර - මහවැලි ගඟ - දකුණු

(2) ගාල්ල - මහවැලි ගඟ - ඌව

(3) මාතර - මැණික් ගඟ - දකුණු

5 වන පිටුව බලන්න.

**18.** එක ම ප්‍රමාණයේ කුඩා ගණක 100ක් ඇත. මෙම ගණක සියල්ල ම යොදාගෙන එකිනෙකට වෙනස් ගණක හැඩති ගොඩවල් කීයක් සෑදිය හැකි ද?

(1) 3　　(2) 4　　(3) 5

**19.** මනුක ළඟ ඇති පාසල් උපකරණවලින් 16ක් හැර ඉතිරිය පෑන් ය. 20ක් හැර ඉතිරිය පොත් ය. 17ක් හැර ඉතිරිය පැන්සල් ය. 19ක් හැර ඉතිරිය අඩිරූල් ය. මේ අනුව මනුක ළඟ ඇති පොත් ගණනත් පැන්සල් ගණනත් පිළිවෙළින් දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) 5, 8　　(2) 4, 7　　(3) 4, 8

**20.** පහත දී ඇති විස්තරය වෙනත් ආකාරයකට නිවැරදිව විස්තර කර ඇති පිළිතුර තෝරන්න.

මෙතුප අඩක් විවර වූ දොරෙන් නිවසට ඇතුළු වී කෑම මේසය මත වූ දොඩම් ගෙඩි දෙකෙන් අඩක් ගෙන කෝප්පයෙන් අඩක් ජලය පුරවා එයට දොඩම් මිරිකා දමා බීවේ ය.

(1) මෙතුප බාගෙට වැසුණු දොරෙන් නිවසට ගොස් බාගයක් ජලය පිර වූ කෝප්පයට දොඩම් ගෙඩියේ යුෂ දමා බීවේ ය.


(2) මෙතුප බාගෙට ඇරුණු දොරෙන් ගෙට ගොස් දොඩම් ගෙඩියක් මිරිකා කෝප්පයට දමා බීවේ ය.

(3) මෙතුප අඩක් ඇරුණු දොරෙන් ගෙට ගොස් දොඩම් ගෙඩියෙන් අඩක් මිරිකා යුෂ කෝප්පයට දමා කෝප්පයෙන් අඩක් ජලය මුසු කොට බීවේ ය.

**21.** ඔරලෝසු මුහුණතක ඇති ප්‍රතිවිරුද්ධ සංඛ්‍යා දෙකක එකතුවට සහ එම සංඛ්‍යා දෙක අතර ඇති වෙනස දැක්වෙන, සංඛ්‍යා දෙකක් **නොවන්නේ** මින් කුමක් ද?

(1) 10 සහ 6　　(2) 8 සහ 6　　(3) 16 සහ 7

**22.** පළමු රූපයේ A අක්ෂරය මත දෙවන රූපයේ B අක්ෂරය සිටින සේ රූප දෙක එක මත එක තැබූ විට දක්නට ලැබෙන සමචතුරස්‍ර ගණන කීය ද?




(1) 13　　(2) 15　　(3) 19

**23.** සතීෂා හොඳින් හිරු පායා ඇති උදෑසන කාලයේ දී නිවස ඉදිරියෙන් ඇති මාර්ගයේ ගමන් කරන විට වම් අත පැත්තෙන් ඇගේ සෙවණැල්ල දක්නට ලැබිණි. තුන්මන්සලකින් හැරී ඉදිරියට ගමන් කරන විට සෙවණැල්ල ඇගේ පිටුපසින් තිබිණි. ඇය නැවතත් එම මාර්ගයේ ම ගමන් කර නිවසට පැමිණියා ය. එවිට ද ඇගේ සෙවණැල්ල දක්නට ලැබුණේ පෙර පරිදිම වම් පසින් සහ පිටුපසින් ය. මේ අනුව ඇය නිවසට පැමිණි වේලාව මින් කුමක් විය හැකි ද?


(1) පෙ.ව. 7.15 -7.30　　(2) ප.ව. 12.00 - 12.30　　(3) ප.ව. 4.00 - 4.30


6 වන පිටුව බලන්න.

**24.** පතුලේ දිග 12cmක් ද පළල 9cmක් ද වන පෙට්ටියක, දිග 6cmක් ද පළල 3cmක් සහ උස 2cmක් වන ඝනකාභ හැඩති දැව කුට්ටි 60ක් ඇසිරිය හැකි ය. මේ අනුව පෙට්ටියේ උස කොපමණ ද?

(1) 10cm (2) 20cm (3) 30cm


**25.** පළමු රූපයේ දැක්වෙන ආකාරයට සමචතුරස්‍රාකාර කඩදාසියක් ගෙන එහි කඩඉරි දිගේ නැවූ පසු දෙවන රූපයේ ආකාරයට ත්‍රිකෝණාකාර හැඩයක් ලැබේ. ඉන් පසු නැවතත් දෙවන රූපයේ දැක්වෙන ආකාරයට කඩඉරි දිගේ නැවූ පසු තෙවන රූපයේ පරිදි ත්‍රිකෝණාකාර හැඩය ලැබේ. එහි වර්ණ කර ඇති කොටස කපා කඩදාසිය දිග හැර බැලූ විට දක්නට ලැබෙන ආකාරය කුමක් ද?



(1) (2) (3)

**26.** පහත රූපයේ දැක්වෙන ඝන වස්තුව කඩඉරි දිගේ කපා සමාන කොටස්වලට වෙන් කළ හොත් දක්නට ලැබෙන ත්‍රිකෝණාකාර සහ සෘජුකෝණාස්‍රාකාර මුහුණත් ගණන කීය ද?



(1) 16, 16 (2) 16, 24 (3) 0, 16


**27.** පියා පස්වරු 5.45ට වැඩ අවසන් වී නිවසට පැමිණියේ ය. ඔහු පැමිණ පැය 4.30ට පසුව නිදා ගත්තේ ය. ඔහු නිදා ගත්තා වේලාව අනුව ඔරලෝසුවේ කටු පිහිටා ඇත්තේ,

(1) සෘජුකෝණයට වඩා වැඩි කෝණයක් ලෙසිනි.

(2) සෘජුකෝණයක් ලෙසිනි.

(3) සෘජුකෝණයට වඩා අඩු කෝණයක් ලෙසිනි.


**28.** එක් එක් රූපය තුළ සංඛ්‍යා යෙදී ඇති රටාව හඳුනාගෙන හිස්තැනට ගැළපෙන පිළිතුර තෝරන්න.




(1) 75 (2) 45 (3) 15

7 වන පිටුව බලන්න.

**29.** මෙම රූපය සම්පූර්ණයෙන් ම වර්ණ කිරීමට එහි වර්ණ කර ඇති ආකාරයේ කොටස් කීයක් අවශ්‍ය වේද?




(1) 12

(2) 20

(3) 24

**30.** පහත දැක්වෙන එක් එක් වෘත්තයේ ඇති සංඛ්‍යාවල එකතුව එකිනෙකට වෙනස් ය. එම එක් එක් වෘත්තයේ සංඛ්‍යාවල එකතුව සමාන කිරීමට ඉලක්කම් මාරු කළ යුතු ආකාරය නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.




(1) A හි 3, C ට ද C හි 2, A ට ද B හි 7, C ට ද C හි 4, B ට ද මාරු කිරීම

(2) A හි 6, B ට ද B හි 5, A ට ද B හි 7, C ට ද C හි 4, B ට ද මාරු කිරීම

(3) A හි 4, C ට ද B හි 7, A ට ද A හි 4, B ට ද මාරු කිරීම

**31.** A හා B පන්තියේ සමාන ළමුන් පිරිසක් බැගින් සිටින අතර පන්ති දෙකේ ම සිටින මුළු ළමුන් ගණන 80කි. B පන්තියේ සිටින පිරිමි ළමුන් මෙන් තුන්ගුණයක් A පන්තියේ ගැහැනු ළමුන් සිටී නම් B පන්තියේ සිටිය හැකි ගැහැනු ළමුන් ගණන විය හැක්කේ,

(1) 25කි. (2) 26කි. (3) 30කි.

**32.** වට්ටියක හොඳින් පිපුණු නා, අරලිය සහ සේපාලිකා මල් 26ක් ඇත. මෙම මල් සියල්ලේ ම ඇති මුළු මල් පෙති ගණන 126කි. මේ අනුව එක් එක් වර්ගයකින් ඇති මල් ගණන කොපමණ ද?

(1) නා මල් 10, අරලිය මල් 9, සේපාලිකා මල් 7


(2) නා මල් 12, අරලිය මල් 7, සේපාලිකා මල් 7

(3) නා මල් 9, අරලිය මල් 12, සේපාලිකා මල් 5

**33.** පියාට නිවාඩු ලැබෙනුයේ දින 14ක් වැඩ කළ පසු එක් දිනක් බැගිනි. ජුනි පළමු දා පියාට නිවාඩු ලැබී තිබුණි. මේ අනුව පියාට වැඩි ම දින ගණනක් නිවාඩු ලැබෙනුයේ කුමන මාසයේ දී ද?

(1) ජූලි (2) අගෝස්තු (3) සැප්තැම්බර්

♦ **පහත රූප සටහනින් දැක්වෙන්නේ සමචතුරස්‍රාකාර කඩදාසියක් ගෙන එය කොටස් කර ඇති ආකාරයයි. ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු තෝරන්න.**




**34.** A, B හා C කොටස්වල එකතුව මෙන් කී ගුණයක් D හා E කොටස්වල එකතුව වේද?

(1) දෙගුණයකි. (2) තුන්ගුණයකි. (3) සිව්ගුණයකි.

**35.** A හි දැක්වෙන ත්‍රිකෝණාකාර කොටස මෙන් කොපමණ කොටස් ප්‍රමාණයක් G හා F කොටස් දෙකෙන් කපාගත හැකි ද?

(1) 10 (2) 12 (3) 14


**36.** එක ම ප්‍රමාණයේ චතුස්තල දෙකක් සාදා එක් එක් මුහුණතක අංක එක බැගින් ලියා ඇත. (1 සිට 8 තෙක් පිළිවෙළින්) ඉන් පසු චතුස්තල දෙකේ මුහුණත් දෙකක් අලවා ඝනවස්තුවක් සාදා ගන්නා ලදි. එහි මුහුණත්වල සංඛ්‍යා එකතු කළ විට ලැබෙන පිළිතුරක් **නොවන්නේ** මින් කුමක් ද?

(1) 29 (2) 25 (3) 23



**37.** පියගැට පෙළක පඩි 60ක් ඇත. මිහිල පඩිපෙළ දිගේ ඉහළට නගින පඩි ගණන මෙන් තුන්ගුණයක් දිමුතු පඩිපෙළ දිගේ පහළට බසියි. දෙදෙනා ම පඩිපෙළ දිගේ ඉහළ සහ පහළ සිට එක ම වේලාවක ගමන් කරයි නම් දෙදෙනා මුණ ගැසෙනුයේ පහළ සිට කී වෙනි පඩියේ දී ද?

(1) 15 (2) 30 (3) 45


**38.**






**?** ලකුණ ඇති තැනට සුදුසු පිළිතුර කුමක් ද?


(1)  (2)  (3) 

**39.** ඊළඟට යෙදිය යුතු රූපය තෝරන්න.




(1)


(2)


(3)

**40.** භාජනයකට ජලය $2l$ ක් පුරවා ඇත. එම ජලය තවත් භාජන 5ක් ගෙන සියයේ ගුණාකාර වන සේ ඒවාට පුරවන ලද්දේ මුල් භාජනයේ $500ml$ ක් ඉතිරි වන ලෙසට ය. අඩු ම සහ වැඩි ම ජල පරිමාවක් පුරවන ලද භාජන දෙකේ ජල පරිමාවේ වෙනස කොපමණ ද?

(1) $500ml$ (2) $400ml$ (3) $300ml$

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**மேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education – Western Province**

**ශිෂ්‍යත්ව ප්‍රතිඵල සංවර්ධන වැඩසටහන - 2026**
**පෙරහුරු ප්‍රශ්න පත්‍රය**

කට්ටල අංක -06

**EXAMINATION FOR GRADE FIVE STUDERNTS FOR SELECTION TO SCHOOL AND FOR THE AWARD OF BURSARIES**
**පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වන ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය**

**කාලය :පැය එකයි මි.15**

**II පත්‍රය**

**විභාග අංකය : ....................................**

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්**

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේ ද ඔබගේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40ක් ඇත. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

**උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.**

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 02 | |
| 03 | |
| 04 | |
| 05 | |
| 06 | |
| 07 | |
| 08 | |
| එකතුව | |
| අවසාන ලකුණු | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| පළමු පරීක්ෂක ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම් කළ බව සහතික කරමි. | |
| | V/I/S |
| දෙවන පරීක්ෂක පළමු පරීක්ෂක කර ඇති ඇගයීම නිවැරදි බව සහතික කරමි. | |
| | V/II/S |
| ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | |
| | V/II/S/EMF |
| ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදි ය. | |
| | V/II/S/CH |

**(1).**පහත දැක්වෙන ඡේදය කියවන්න.

වනය ඉතා අලංකාර ය.හැම තැනකම ඇති ගස්වැල් හා ඒවායේ හට ගන්නා මල් සහ ගෙඩි එහි අලංකාර බව වැඩි කරයි. වනාන්තර හා සතුන් නොමැති වූ විට මිනිසා ද දැඩි හුදෙකලා බවින් මිය යන බව රතු ඉන්දියානු නායක සියැටල් ද ප්‍රකාශ කරයි.

වනයේ සැරිසරන කුරුල්ලන්ගේ නාදය වනයේ නිහඬ බව බිඳියි.වනාන්තර නිසා වර්ෂාව ලැබේ.අධික හිරු රශ්මිය අඩුවේ.ගෝලීය උණුසුම නැති වන්නේ ද වනාන්තරය නිසාය.

නොයෙකුත් මිනිස් ක්‍රියාකාරකම් නිසා වනාන්තර විනාශ වෙමින් තිබේ.වනාන්තරවලට කරන හානිය නතර කළ යුතුයි.ඒ සඳහා නීති රීති ක්‍රියාත්මක කළ යුතුය. ගස් සිටුවීමට හුරු කළ යුතු ය.ගස්වැල් රැක ගැනීමට කුඩා කල සිට ම පුරුදු කළ යුතුය. ගස්වැල්වලට මෙන්ම සතුන්ට ද සොබා දහමට ද ආදරය කිරීමට පුරුදු විය යුතු ය.

ඡේදය ඇසුරින්ම පිළිතුරු සපයන්න.

i.වනයේ අලංකාර බව වැඩි කරන්නේ මොනවා ද ?

.............................................................................................

ii.රතු ඉන්දීය නායක සියැටල් කළ ප්‍රකාශය ඡේදයෙන් උපුටා ලියන්න.

.............................................................................................

iii.වනාන්තරවලින් ලැබෙන ප්‍රයෝජන දෙකක් ලියන්න.

.............................................................................................

.............................................................................................

iv.වන විනාශය නැවැත්වීමට කළ හැකි දෙයක් ලියන්න.

.............................................................................................

v. "තුරු ලතා" යන්නට සමානාර්ථ පදයක් ලියන්න.

.............................................................................................

vi. "අයහපත්" යන වචනයේ විරුද්ධාර්ථ පදය සොයා ලියන්න.

.............................................................................................

vii.මෙම ඡේදයට වඩාත්ම සුදුසු මාතෘකාව තෝරා යටින් ඉරක් අඳින්න.

- සුන්දර වනාන්තර
- වනයක අසිරිය
- වන සම්පත රැක ගනිමු

**(2).** පහත සඳහන් එක් එක් වගන්තියට ගැළපෙන සේ වරහන තුළ ඇති ක්‍රියාපද ලේඛන වහරට හරවා හිස්තැන මත ලියන්න.

1.ඇය මුළුතැන්ගෙය හොඳින් පිරිසිදු ..........................................(කළා)

2.මුවා ද මුව දෙන ද වැවට බැස දිය ..........................................(බොනවා)

3.දිය පහර වේගයෙන් පහළට ..........................................(ගැලුවා)

4.ඇය හැමදෙනාට ම කරුණාව .......................................... (දක්වනවා)

5.ඔවුහු සතුටින් වගකීම් ..........................................(දැරුවා)

**(3).** පහත සඳහන් වාක්‍ය ලිඛිත බසට හරවා ලියන්න.

1.රසිකා හැමදාම ක්‍රීඩා පුහුණුවීම්වලට යනවා

..........................................................................................

2.සංජීව ග්‍රහලෝක පිළිබඳ ප්‍රශ්න ඇසුවා

..........................................................................................

**(4).** පහත සඳහන් එක් එක් වගන්තියේ වැරදි අක්ෂර සහිත වචනය බැගින් ඇත.එම වචනය නිවැරදි කර වාක්‍ය නැවත ලියන්න.

1.පරිගණකය වර්ථමාන ලෝකයේ අත්‍යවශ්‍ය අංගයක් බවට පත්ව ඇත.

..........................................................................................

2.වාර්ශික වෛද්‍ය සායනය ප්‍රධාන ශාලාවේ දී පැවැත්වේ.

..........................................................................................

**(5).** පහත වචන නිවැරදිව ගළපා වගන්ති නැවත ලියන්න.

1.පරිහරණය/දැනුම/ගනිති/සිසුහු/පුස්තකාලය/කිරීමෙන්/රැස්කර

..........................................................................................

2.බිඳියි/නිහඬ/බීව්/නාදය/බව/කීව්/පරිසරයේ/කුරුල්ලන්ගේ

..........................................................................................

**(6).** පහත සඳහන් අවස්ථාවට ගැළපෙන ප්‍රස්තාව පිරුළ තිත් ඉරි මත ලියන්න.

තමා අවට සමාජය පිළිබඳ අවබෝධයක් නොමැතිව සිටීම

..........................................................................................

**(7).** පහත වගන්තියෙහි අදාළ ස්ථානවල විරාම ලකුණු යොදන්න.

| |
|---|
| ආතර් වී දියෙස් කොස් මාමා නමින් ද හඳුන්වයි |

**(8).**යුගල පද සම්පූර්ණ කරන්න.

අනම්..........................................................


................................................................ තහළු


**(9).**පහත වාක්‍යය අතීත කාල බහුවචනයට හරවා ලියන්න.

ඔහු ලස්සන සරුංගලයක් හදයි

...........................................................................................................................................

**(10).එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය දී ඇති කොටුව තුළ ඉංග්‍රීසි අකුරින් ම ලියන්න.**





| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | |

| | | | |
|---|---|---|---|
| | | | |

**(11).පහත දී ඇති වචන නිවැරදිව ගළපා අර්ථවත් වැකියක් බැගින් ලියන්න.**

1.the/temple/go/We/to

...........................................................................................................................................

2.it/like/you/Do

...........................................................................................................................................

**(12).එක් එක් ඉංග්‍රීසි වචනයෙහි අර්ථය සිංහලෙන් ලියන්න**

1.Library - ...............................................................................

2.Cabbage - ...............................................................................

**(13). "වාළෛප්පළම්" යන දෙමළ වචනය සඳහා යෙදෙන සිංහල වචනය ලියන්න.**

...........................................................................................................................................

**(14).පහත සඳහන් වාක්‍යය දෙමළෙන් කියන ආකාරය සිංහලෙන් ලියන්න.**

මෙන්න වතුර බොන්න

.............................................................................................................................

**(15).එක්තරා නගරයක ජන සංඛ්‍යාව <u>38 470</u> කි.මෙහි ඉරි ඇඳි සංඛ්‍යාවේ සංඛ්‍යා නාමය ලියන්න.**

.............................................................................................................................

**(16).25 760 සංඛ්‍යාවේ 5 ඉලක්කමෙන් නිරූපිත අගය ලියන්න.**

.............................................................................................................................

**(17).සංඛ්‍යා රටාවේ හිස්තැන් සම්පූර්ණ කරන්න.**

7, 28, 112 ...................... ......................

**(18).ලීටර හා මිලි ලීටර ගුණ කරන්න.**


| l | ml | | l | ml |
|---|---|---|---|---|
| 3 | 515 | | 8 | 90 |
| | X 3 | | | X 4 |

**(19).කිරිපිටි 250g ක මිල රුපියල් 500.00කි.කිරිපිටි 2kg 100g ක මිල සොයන්න.**

**(20).**

| ඝන වස්තුව | දාර | ශීර්ෂ |
|---|---|---|
|  | | |
|  | | |

**(21).**



(i).මෙම රූපයේ පාට කළ කොටස දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න…...........................................................

**(22)**

| එළවළු වර්ගය | **1kg ක මිල (රු.)** |
|---|---|
| බෝංචි | 275.00 |
| වම්බටු | 180.00 |
| මෑ කරල් | 100.00 |
| වට්ටක්කා | 110.00 |

මෙහි සඳහන් සෑම එළවළු වර්ගයකින් ම 250g බැගින් මිලට ගෙන රු.1000.00ක් දුන් විට ලැබෙන ඉතිරි මුදල කීයද?..................................................

**(23).**පාපැදියක මිල රුපියල් 27575.00 කි. නිමල් ළඟ රු.12500.00 ක් තිබේ. නිමල්ගේ තාත්තා ඔහුට රු.8500.00 ක මුදලක් දුන්නේ ය. පාපැදිය මිලදී ගැනීමට ඔහුට තව කොපමණ මුදලක් අවශ්‍ය වේද? ...................................

**(24).**ටැංකියක ජලය 35l 500ml තිබේ.දිනක් පාවිච්චි කළ පසු එහි ඉතිරි වූ ජල ප්‍රමාණය 4l 700ml කි. පාවිච්චි කළ ජල ප්‍රමාණය

..........................l ..................................................ml

**(25).**64kg 500g ක් බර හාල් ප්‍රමාණයක් සමානව බෑග් 4කට දමන ලදී.එහි බෑගයකට දමන ලද හාල්වල බර

.............................kg ........................................g

**(26).**පෙරවරු 10.20 ට මහනුවරින් පිටත් වූ බස්රථයක් පැය 4 මිනිත්තු 45 කට පසු කොළඹට ළඟා විය.බස් රථය කොළඹට ළඟා වූ වේලාව සම්මත ක්‍රමයට ලියන්න.


..................................................................................

**(27).**58km 150m ක දුරක් බස්රථයෙන් ද 5km 900m ක දුරක් දුම්රියෙන් ද ගමන් කළ සංචාරකයෙක් බස් රථයෙන් හා දුම්රියෙන් ගමන් කළ මුළු දුර සොයන්න.

.............................km ......................................m

**(28).**ටොෆි පැකට්ටුවක තිබූ ටොෆි සියල්ලම එක් ළමයෙකුට 7 බැගින් ළමුන් 14 දෙනෙකුට බෙදා දුන් පසු ටොෆි 2ක් ඉතිරි විය.ටොෆි පැකට්ටුවේ තිබූ මුළු ටොෆි ගණන කීය ද? ..................................................

**(29).**සිසුන් කණ්ඩායමක් තමන් වඩාත්ම කැමති පලතුරු වර්ගය පිළිබඳ තොරතුරු පහත තීරු ප්‍රස්තාරයෙන් දැක්වේ.කණ්ඩායමේ මුළු ළමයි ගණන 70 ක් නම් පේරවලට කැමති ළමයි ගණන ප්‍රස්තාරයේ ඇඳ දක්වන්න.




**අංක 30 සිට 59 තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුර දී ඇති පිළිතුරු අතුරෙන් තෝරා යටින් ඉරක් අඳින්න.**

**(30).**ගංගා මෝය හා කලපු ආශ්‍රිත ප්‍රදේශයන්හි වැඩෙන කඩොලාන ශාකයකි.

1.හීන් බෝවිටියා 2.ගොඩපර 3. කදුරු

**(31).**ගෙවතු වගාවේ දී ආරක්ෂාව සඳහා යොදා ගන්නා සාම්ප්‍රදායික ක්‍රම ශිල්පයක් නොවේ.

1.කොහොඹ ඇට දියර භාවිතය

2.වගාවන් සඳහා අළු යෙදීම

3. යූරියා පොහොර යෙදීම

**(32).**විටමින් "B" බහුල මාශ බෝගයකි

1. නිවිති 2.දොඩම් 3. කඩල

**(33).**භූමියේ විවිධත්වය කෙරෙහි බලපාන ස්වාභාවික හේතුවක් වන්නේ

1.ක්‍රීඩා කිරීමට තැනිතලා භූමි සකස් කිරීම

2.වර්ෂාව නිසා පස සේදී යාම

3.මිනිසාගේ විවිධ අවශ්‍යතා සඳහා කඳු ප්‍රදේශ කපා තැනිතලා බිම් සකස් කිරීම

**(34).**අතීතයේ දී වැඩ පහසු කර ගැනීමට සතුන් යොදා ගන්නා ලදී.ඒ අනුව බර ගෙන යැමට යොදා ගත් සතුන් ඇතුළත් පිළිතුර වන්නේ

1.අශ්වයා,බූරුවා 2.බූරුවා,බල්ලා 3 .බූරුවා ,ගවයා

**(35).**විටමින් හා ඛනිජ ලවණ සහිත ආහාර ශරීරයට අවශ්‍ය ප්‍රමාණයට නොලැබුණු විට ඇතිවන තත්ත්වයකි.

1. කට කොන් වණවීම 2.සිරුරේ බර අඩුවීම 3.රක්තහීනතාව ඇතිවීම

**(36).**පාසල් සිසුන් වැඩි දෙනෙක් ස්ථූලතාවයට ගොදුරු වී සිටියි.ස්ථූලතාවයට ප්‍රධාන හේතුවක් වන්නේ

1. ප්‍රමාණවත් තරම් ආහාර නොගැනීම

2.ව්‍යායාම නොකිරීම

3. නියමිත වේලාවට ආහාර නොගැනීම

**(37).** "මොණරවිල කැප්පෙටිපොළ දිසාව" පිළිබඳ තොරතුරු ඇතුළත් පිළිතුර තෝරන්න.

1. ශ්‍රී වික්‍රම සර්ව සිද්ධි නමින් රජ විය.

2.මුල් නාමය වූයේ දාවිත් හෙවත් ඩේවිඩ් ය

3.ඌව වෙල්ලස්ස කැරැල්ල මර්දනය කිරීම පිණිස ඉංග්‍රීසීන් විසින් යවන ලද්දේ ය

**(38).**වැඩ පහසු කර ගැනීමේ දී කප්පි යොදා ගන්නා අවස්ථාවක් නොවේ.

(1) 

(2) 

(3) 

**(39).**ගෙවතු වගාවේ දී වගාවට හානි කරන කෘමි සතුන් කවුරුන්ද?

1. බඹරා,බත්කූරා 2. මොනරා,ඉල්මැස්සා 3. පිටි මකුණා,පලතුරු මැස්සා

**(40).**පොදු වාහනවල ගමන් කරන මහජනතාව දැනුවත් කිරීම සඳහා පොදු වාහනවල ප්‍රදර්ශනය කරනු ලබන පාඨයකි

1.ප්‍රවේශමෙන් රිය පදවන්න.

2.ජංගම දුරකථන භාවිතයෙන් වලකින්න.

3. ප්‍රවේශපත් නොමැතිව ගමන් කිරීම දඩුවම් ලැබිය හැකි වරදකි

**(41).** උණුවතුර වැටී පිලිස්සුණු අවස්ථාවක දී ප්‍රථමයෙන් ම කළ යුත්තේ

1.පිලිස්සුණු ස්ථානයේ දන්තාලේප ගැල්වීම

2. දැවිල්ල අඩුවනතුරු පිලිස්සුණු ස්ථානය ජල කරාමයකට අල්ලා සිටීම.

3. පිලිස්සුණු ස්ථානයට තෙල් වර්ගයක් ගැල්වීම

**(42).**හේන් වගාවේ දී භාවිත වන උපකරණයකි.

1.වහන්පතුරු 2.දිදාලය 3. පෙනේරය

**(43).**මිනිස් ක්‍රියාකාරකම් නිසා සත්ත්ව කොට්ඨාසයන්ට හානි සිදුවෙන අවස්ථා තිබේ.එවන් අවස්ථාවකි,

1. වගාවේ දී කාබනික පොහොර භාවිත කිරීම
2. මසුන් ඇල්ලීම සඳහා වැරදි ක්‍රම භාවිතය
3. වනාන්තර වගා කිරීම

**(44).**"විදුලිය අරපිරිමැස්මෙන් භාවිත කරමු". යන මාතෘකාවට අදාළව නිර්මාණය වන පෝස්ටරයකට සුදුසු ම පාඨය තෝරන්න.

1. විදුලි උපකරණ භාවිතයෙන් වලකින්න.
2. L.E.D. විදුලි පහන් භාවිතය වැඩි කරමු.
3. දිවා කාලයේ දී විදුලිය භාවිත නොකරමු.


**(45).**මහා මාර්ග භාවිතයේ දී රියදුරන් විසින් අනුගමනය කළ යුතු මාර්ග නීතියකි.

1. වට රවුමකදී දකුණු පසින් එන වාහනවලට ඉඩ දීම.
2. රියදුරන් විනීතව හැසිරීම.
3. තරගකාරී ලෙස රිය පැදවීම.

**(46).**පුත්තලම හා කෑගල්ල දිස්ත්‍රික්ක අයත්වන පළාත් දෙක පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

1. වයඹ පළාත,සබරගමු පළාත 2. ඌව පළාත,වයඹ පළාත 3. සබරගමු පළාත,වයඹ පළාත

**(47)**



මෙහි දැක්වෙන සුළං දිශා දර්ශකයට අනුව සුළං හමා එන දිශාව කුමක් ද?

1. බටහිර දිශාව
2. නැගෙනහිර දිශාව
3. උතුරු දිශාව

**(48).**සමනොළ කන්දෙන් ආරම්භ වී අම්බලන්තොටින් මුහුදට වැටෙන ගංගාව කුමක්ද?

1. ගිං ගඟ 2.වලවේ ගඟ 3. මැණික් ගඟ

**(49).**ශ්‍රී ලංකාව පිහිටා ඇත්තේ අප්‍රිකානු රටවල්වලට කුමන දිශාවෙන් ද?

1. බටහිර දිශාවෙන් 2.නැගෙනහිර දිශාවෙන් 3. උතුරු දිශාවෙන්

**(50).**සූර්යයා හා චන්ද්‍රයා අතරට පෘථිවිය පැමිණීමෙන් සිදුවෙන්නේ

1. සූර්යග්‍රහණයකි 2. චන්ද්‍රග්‍රහණයකි 3. පරිභ්‍රමණයකි

**(51).** රාජ්‍ය ලාංඡනයේ ස්වයංපෝෂිත බව හා සශ්‍රීකත්වය නිරූපණය කරන්නේ

1. පුන්කලස  2. ඉර,හඳ  3.වී කරල්

**(52).**පෙති හයක් ඇති සුවඳවත් මලකි

1. ඉද්ද මල  2. සල් මල  3.අරලිය මල

**(53).**අහසට ඉනිමං බඳින ගොනෙක් ඇත - ඒ ලකුණේ ගොන් අප දුටුවේ නැත.


මෙම ගීතය ගයමින් කරනු ලබන ජන ක්‍රීඩාව වන්නේ

1. එළුවන් කෑම  2.පනා හැංගීම  3.ඉනි වැට පෙරලීම

**(54).**ශ්‍රී ලංකාවේ රෝපණය කළ මුල් ම තේ ගස ඇත්තේ

1. රිටිගල කන්දේ ය  2.ලූල් කඳුර වතුයායේ ය  3. ගම්පහ සෙනරත්ගොඩ උද්‍යානයේ ය

**(55).**




රූපයේ දක්වා ඇත්තේ ජලය පුරවා ඇති බෝතලයකි.මෙහි A නැමැති සිදුරෙන් පිටවන ජලය

1.වැඩි දුරකට විදියි.

2.අඩු දුරකට විදියි.

3.තරමක් දුරකට විදියි.


**(56).**ඉවතලන අපද්‍රව්‍ය වර්ගීකරණය කිරීමේ ප්‍රධාන වාසියකි.

1. පරිසරය තවදුරටත් අපවිත්‍ර වීම
2. අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය පහසුවීම
3. කොම්පෝස්ට් පොහොර සෑදීමට අපහසුවීම

**(57).**වර්ධක ආහාර කාණ්ඩයට අයත් ආහාර ඇතුළත් පිළිතුර තෝරන්න.

1. බත්, ඉඳි ආප්ප, මඤ්ඤොක්කා  2. කිරි,බිත්තර,සෝයාමීට්  3. රටකජු,බටර්,චීස්

(58)



රූපයේ දැක්වෙන පරීක්ෂණය සිදු කිරීමේ දී අපට දැක ගත හැකිවන්නේ,

(1). පාසල් වත්තෙන් හා වගුරු බිමෙන් ලබාගත් පස් නියැදිවල සමාන ප්‍රමාණයක් ජලය රඳවා ගන්නා බවයි.

2). වැසි ජලය වැඩි ප්‍රමාණයක් රඳවා ගැනීමේ හැකියාව වගුරුබිම්වල පවතින බවයි.

(3). B හි පහළින් තැබූ භාජනයට අඩු ජල ප්‍රමාණයක් එකතු වී ඇති බවයි.

**(59).** සඳෙහි බලපෑම නිසා මුහුදේ ජල මට්ටම ඉහළ යෑම හඳුන්වන්නේ

1. වඩදිය  2.බාදිය  3. .මිරිදිය

**(60).**ඔබේ යහළුවා චිත්‍ර තරගයෙන් පළමුවැනියා වී ඇති බව දැනගත් මොහොතේ......................... ඔබට ඇති වූ සිතුවිලි පිළිබඳව වාක්‍ය 3ක් ලියන්න.උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය නිවැරදි විය යුතුය.

.................................................................................................................................................

.................................................................................................................................................

.................................................................................................................................................

.................................................................................................................................................

.................................................................................................................................................

.................................................................................................................................................

.................................................................................................................................................

.................................................................................................................................................